# සාර්නාත් ''සිංහ කුළුණේ'' සංකේතාර්ථය

ආචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ

සාර්නාත් සිංහ කුළුණ සොයා ගන්නා ලද්දේ ක්‍රි.ව. 1905 දී ය.[1] මුලින් එය ක්‍රි.පූ. 3 වැනි සියවසේ දී අශෝක අධිරාජයා විසින් කරවන ලද්දකි. බුදුන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව වූ ධම්මචක්කප්පවත්තන දේශනාව අනුස්මරණය කිරීම සඳහා එය එසේ පිහිටුවන ලදි. ශිලා ලේඛනයක් සහිත මෙම කුළුණ අශෝක අධිරාජයා විසින් පිහිටුවන ලද දැනට සොයාගෙන ඇති කුළුණු 14න්[2] ශ්‍රේෂ්ඨතම නිර්මාණය බව අවිවාද යෙන් පිළිගෙන තිබේ.[3]

සාර්නාත් සිංහ කුළුණ යයි සාමාන්‍යයෙන් මෙය හඳුන්වනු ලබන නමුත් සිංහ කුළුණ කට වඩා එය ධර්මචක්‍ර කුළුණක් වශයෙන් හැඳින්වීම නිවැරදි බව මුලින් ම සඳහන් කළ යුතුය. මුලදී මේ කුළුණේ ප්‍රධාන සංකේතය ලෙස සිංහයන්ගේ හිස් මත සවි කරණ ලද ධර්ම චක්‍රයක් විය. එය මේ කුළුණ පිහිටුවීමේ අරමුණ වූ ධම්මචක්කප්පවත්තන දේශනාව හා අත්‍යන්තයෙන් සම්බන්ධ වන්නකි. මේ කුළුණේ සිංහයන්ට ලැබෙන්නේ දෙවන ස්ථානයයි. පසුව මේ කුළුණ මුදුනේ තිබුණ ධර්මචක්‍රය ගැලවීගොස් සිංහයන් සතරදෙනා සහිත කොටස වෙනම සොයාගන්නා ලදි. එම නිසා මුලින් එසේ සොයා ගත් අය විසින් එය සිංහ කුළුණක් වශයෙන් හඳුන්වන ලදි. මේ ව්‍යවහාරය අශෝක රජතුමා මුලින් මේ කුළුණ පිහිටුවීමේ දී බලාපොරොත්තු වූ අදහස ආවරණය වීමට හේතුවක් ද වෙයි.

මේ කුළුණ ප්‍රධාන කොටස් පහකින් යුක්ත වෙයි. යට සිට අනුක්‍රමයෙන් බලන විට පළමු කොටස වන්නේ ස්තම්භය යි. එය මුල සිට අගට ක්‍රමයෙන් සිහින් වන අන්දමට නෙලා ඔප දමා ඇත. අනෙක් අශෝක කුළුණුවල ද මේ ලක්ෂණ දක්නට ලැබේ. දෙවනුව පූර්ණඝටාකාරය දක්වන පහතට නැමුණු දිග පෙතිවලින් යුක්ත පද්මය වෙයි.[4] පූර්ණඝටයත් පද්මයත් දෙකම එක් විට දැක්වීමට ඉන් අදහස් කළා විය හැකිය. තුන් වැනි ව පද්මය මත (ඇත්ත වශයෙන් ම පද්මයේ කෙමියෙහි) වූ රවුම් ඵලකය යි. සිව් වෙනුව එම ඵලකය මත හතර දිසාවට මුහුණ ලා නාද කරන සිංහයන් සතර දෙනෙකි. ඉදිරි පසින් සිංහයන් හතර දෙනෙකුන් ලෙස පෙනෙතත් ඒ හතර දෙනා ම පසු අර්ධ-යෙන් ඒකාබද්ධව ඇත. පස්වෙනු ව සිංහයන් සතර දෙනාගේ මස්තකයන්හි පිහිටි අර (ගරාදි) 32 කින් යුත් ධර්ම චක්‍රය වෙයි.

ඵලකය වටේ පිටතින් කැටයම් කර ඇති හස්ති, අශ්ව, ගව, සිංහ රූප හා සතර දිසාවට මුහුණ ලා සිටින සිංහයන් සතරදෙනාට සමාන්තර ව කුඩා ප්‍රමාණයේ චක්‍ර සතරක් ද වෙයි.

අශෝක අධිරාජයා මේ කුළුණෙන් තමන්ගේ ම දර්ශනය හා මානව සම්බන්ධතාව පිළිබඳ දර්ශනය ඉදිරිපත් කරතියි වී. ඇස්. අග්‍රවාලා කියයි.[5] වැඩිදුරටත් එය විස්තර කරමින් ඔහු මෙසේද සඳහන් කරයි.[6] ජීවිතය හා පරිපාලනය පිළිබඳව අශෝක දර්ශනය මූලික කරුණු තුනකින් යුක්ත ය. අශෝක රජතුමා සහ ජනතාව අතර සම්බන්ධය

ඉන් පළමු වැන්නයි. දෙවැනි කරුණ වනුයේ අශෝක රජතුමාගේ රාජ්‍ය තත්වයයි. මේ කරුණු දෙක අශෝක රජුට කලින් හා පසුව සිටි වෙනත් පාලකයන් විසින් ද බෙද ගන්නා ලදි. එහෙත් තුන් වැනි කරුණ වූ අශෝක ධර්මය එතුමාට විශේෂ වූවකි. සාර්නාත් කුළුණෙන් දක්වන සංකේතාර්ථය වශයෙන් මේ කරුණු තුන දැක්විය හැකිය.

මේ කුළුණ පිහිටා ඇත්තේ ගෞතම බුදුන් වහන්සේ ධම්මචක්කප්පවත්තන සූත්‍රය දේශනා කරන ලද බරණැස ඉසිපතන නම් වූ මිගදායෙහි ය. අශෝක රජතුමා මේ ස්ථානයේ මෙබඳු කුළුණක් පිහිට වූයේ එම සිද්ධිය අනුස්මරණය කිරීම සඳහා ය. මෙහි බුදුන් වහන්සේ ධර්ම චක්‍රය පැවැත්වූහ. එනිසා එම ක්‍රියාත්මක ධර්ම චක්‍රය මේ කුළුණේ ප්‍රධාන සංකේතය වී තිබේ. ලොකය වටා සිව්දිසාව නියෝජනය කරමින් චක්‍ර හතරක් ද දක්වා ඇති බව මීට පළමු සඳහන් කෙළෙමි. මුදුනේ ධර්ම චක්‍රයත් සමග චක්‍රපහක් මේ කුළුණෙහි තිබේ. ඒවා ක්‍රියාත්මක චක්‍ර බව විශේෂයෙන් ඵලකය වටා ධර්මචක්‍ර අතර දුවන හස්ති, අශ්ව, සිංහ හා ගව රූපවලින් කියැවෙයි. බුදුන් වහන්සේගේ ධර්මචක්‍රය හතර දිසාවෙහිම ප්‍රවර්තනය වන බව ඇඟවීමට ඒ ඒ දිසාවට යොමු වූ ධර්ම චක්‍ර හතරක් දැක්වීමෙන් කියැවෙයි. මුදුනේ ඇති ධර්ම චක්‍රයෙන් බුදුන් වහන්සේගේ ධර්මයෙහි ශ්‍රේෂ්ඨත්වය පළ වෙයි. හතර දිසාවට යොමු වූ සිංහයන් විවෘත මුඛ සහිතව සිටීමෙන් බුදුන් වහන්සේගේ දේශනාව සතර දිසාවට පැතිරෙන අයුරින් දෙශනා කරන බව පැවසෙයි. සිංහ රූපවලින් බුදුන් වහන්සේ නියෝජනය වෙති. පද්මය දක්වා ඇති ආසනයක මේ සිංහයන් සිටින්නේ බුදුන් වහන්සේගේ ලෝකෝත්තරත්වය දැක්වීමට ය. මේ අන්දමට සාර්නාත් කුළුණේ සංකේත සංකීර්ණයෙන් බුදුන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව විස්තර කරන බව පෙනේ.

බුදු දහම හා අශෝක ධර්මය අතර සම්බන්ධය මෙන්ම රාජ්‍යත්වය හා බුද්ධත්වය පිළිබඳ සම්බන්ධය ද මෙහිලා සැලකිය යුතුයි. අශෝක රජුත් බුදුන් වහන්සේත් ධර්මය ප්‍රධාන කොට සැලකූහ. ධර්මධවජව (ධම්මද්ධජො), ධර්මය කේතුවක් කොටගෙන (ධම්මකෙතු) කටයුතු කිරීමට මේ දෙදෙනාම මහ පෙන්නූහ. අශෝක රජතුමා බෞද්ධ චක්කවත්තිරාජ සංකල්පය අනුගමනය කළ ප්‍රථම බෞද්ධ අධිරාජයා ලෙස සැලකිය හැකිය. චක්කවත්ති රජුගේ සංකේතය ද ධර්ම චක්‍රයයි. බුදුන් වහන්සේ ද ධර්ම චක්‍රය සිය සංකේතය කොටගත් බව උන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාවෙන් ම ඔප්පු වෙයි. ඒ සමඟ ම බුදුන් වහන්සේ ද චක්කවත්ති රජෙකු ලෙස සලකනු ලැබෙති. මෙම දෘෂ්ටිකොණයෙන් බලන විට සාර්නාත් කුළුණෙන් බුදුන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව පමණක් නොව බුදුන් වහන්සේත අශෝක රජතුමාත් දෙදෙනාම ජනතාව ලෞකික හා පාරලෞකික දියුණුව කරා පමුණුවන ධම්මරාජයන් ලෙස විස්තර වන බව කිව හැකිය.

---

1. Vincent A. Smith, A History of Fine Art in India and Ceylon third edition, Bombay 1, p. 18.
2. පාහියන් ඉන්දියාවට පැමිණි විට දුක ඇත්තේ අශෝක කුළුණු 6 ක් පමණි. නමුත් ඔහුට පසු පැමිණි හියුන් ත්සාන් කුළුණු 15 ක් දක තිබේ.
3. V. S. Agrawala, **Studies in Indian Art**, Varanasi 1965, p. 67.
4. මෙය මුලදී ඝණ්ටාකාර මෝස්තරයක් වශයෙන් හඳුනගෙන තිබුණි. දෙවනුව ඝණ්ටාකාර පද්ම මෝස්තරයක් ලෙස එය හඳුන්වා තිබේ.
5. V. S. Agrawala, op. cit., pp. 68-69.
6. එම.